# අශ්වඝෝෂාචාර්යපාදයාණන් වෘක්ෂලතා සහ සත්ත්ව වර්ග  පිළිබඳ දැක්වූ ආකල්පය පිළිබඳ අධ්‍යයනයක්


**ගංගොඩවිල චන්දිම හිමි**

**තාවකාලික නිබන්ධක**

**භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**Chandima1984@gmail.com**


බහුමානයට සම්ප්‍රාප්ත වූ සංස්කෘත සාහිත්‍යාම්බරයෙහි ප්‍රජ්වලිත නාමයක් දරන්නා වූ අශ්වඝෝෂ යතිවරයාණන්ගේ කෘති කිහිපයක් ඇසුරින් තදීය ව ප්‍රකටීභූත වන්නා වූ වෘක්ෂලතා සහ සත්ත්ව වර්ග පිළිබඳ අධ්‍යයනයක් මෙහි දී අභිප්‍රේත ය.

(1) අශ්වඝෝෂ හිමි වනයන් ත්‍රිකයක් හඳුනා ගනියි. ඒ වන, අරණ්‍ය, කාන්තාර[1] වශයෙනි. **(තපඃ ප්‍රශාන්තං ස වන විවේශ)**[2] **(වන තරුවෝ)**[3] **(එතාන්‍යරණ්‍යාතභිතඃ ශිවානි යෝගානුකූලාන්‍යජනේ)**[4] ඔහුගේ කෘතිවල දැක්වෙන කඳු සහිත ප්‍රදේශ සහ විශාල ගිරි ඝන වූ කැලයන්ගෙන් ද නගර හරිතාවරණයෙන් ද සමාංකිත වූ බව ස්ඵුට වේ.[5] පාණ්ඩු කන්ද තදුක්ක කැලයන් හේතුවෙන් ඝන නීල වර්ණයෙන් යුක්ත ය.[6] හිමාලය කඳුකරය සපුරා ම සුගන්ධිත කැලයන්ගෙන් ද වැව්, ඇල, දොල, ගංගා යනාදියෙන් අලංකෘත වී ඇත. **(තෙ දේවදාරුත්තමගන්ධවන්තං නදී සරඃ ප්‍රස්‍රවණෞඝවන්තං)**[7] කතුවරයාණන්ගේ වනයන් සබැඳි ව පැවැති අභිලාෂය තවදුරටත් විද්‍යමාන කරවන්නේ ඔහු වනයන් යනු පෘථිවියේ මතුපිට පවත්නා නාභිය ලෙස හඳුන්වා ඇති හේතුවෙනි.[8] තවද, බුදුරජාණන්වහන්සේ ස්වකීය ආසනය පරීක්ෂා කිරීමේ දී වන වෘක්ෂයන් සුළඟින් පවා නොසැලුණු බව සඳහන් වේ.[9] විවිධ යාගයන් සහ රුක්ෂ ව්‍රතයන් සිදු කිරීම නිසා දුර්වර්ණ වූ වන වෘක්ෂයන් පිළිබඳව ද සඳහනක් ඇත. **(හවිර්ධූමවිවර්ණ වෘක්ෂම් තපප්‍රශාන්තං සවර්නම්)**[10]

(2) ඵලමලින් පරිමිත වූ වනවෘක්ෂයන් අශ්වඝෝෂ හිමිගේ කෘතිවල දක්නට ලැබෙන සාමාන්‍ය සංසිද්ධියකි.[11] තද්කාලයේ කඳුකැට මෙන් වෛපුල්‍ය වූ වෘක්ෂ කඳන් ද වූ බව පෙනේ.[12] වෘක්ෂ අතුරින් පාරිජාත **(හාරශෘගාර)** යන වර්ගය තෙදවත් සේ සියලු ප්‍රභේදයන් විද්‍යමාන කරන්නකි.[13] අවශිෂ්ට ව දෘශ්‍යමාන වන වෘක්ෂයන් අතර නාගභෘක්ෂ[14], නාගකේශර[15] ගන්ධපර්ණ[16], තමාල[17], සාල[18], තිලක[19], කදම්බ[20],



Created with nitroPDF professional
download the free trial online at nitropdf.com/professional

ප්‍රියංගු[21], පෛපපල[22], තාලහෘක්‍ෂ[23], යනාදිය ප්‍රමුඛ වේ. අලක්තකප්‍රභ ලෙස දැක්වෙන එනම් පුරපෝදින ලතු මෙන් බබළන කුර්බක වෘක්‍ෂය ද දක්නට ලැබෙන්නකි.[24] වජ්‍රසූචියට අනුව බට, බකුල, පලාශ, අශෝක, තමාල, නාගකේශර, ශිරීෂ, චම්පක යන වෘක්‍ෂ පෙන්වා දී තිබේ.[25]

(3) සඵල වෘක්‍ෂයන් පිළිබඳව ද අශ්වඝෝෂ යතිවරයාණන්ගේ දැනුම සුළුපටු නොවේ. අඹගස තමාගේ ප්‍රියතමය වන බවත්[26], කෙසෙල්[27], හා ජම්බු[28] ගස් ද තදීය යුගයේ මනෝඥ වෘක්‍ෂ අතර වූ බවත් දැක්වේ. බෝධිසත්ත්වවරයාණන් වහන්සේ අතිදුෂ්කර වූ ව්‍රතයන් රක්‍ෂණයේ දී ජුජුබ්ඵල, තල ඇට හා ආහාර ධාන්‍ය මත පමණක් දිවි ගෙවූ බව ඉස්මතු කොට ඇත.[29] සෞන්දරනන්ද මහාකාව්‍යයේ ඉන්ද්‍ර දෙවියා විස්තර කරන එක් අවස්ථාවක දී විවිධ වර්ණ සහිත සඵල වෘක්‍ෂ රාශියක් දක්වා තිබීම ද විශේෂ ය.[30]

(4) වනදර පිළිබඳ ව කතුවරයාගේ ආකල්පය ද වැදගත්ය.[31] දර ද්විත්‍වයක් ඒකී ව  ඝර්ෂණය කිරීමෙන් අග්නිය නිපදවා ගත හැකි බව තද්යුගයේ පිළිගෙන තිබුනි.[32] සින්දුවාර නමින් විශේෂිත පඳුරු වර්ගයක් පොකුණු සමීපයේ වර්ධනය වී ඇතැයි **(දීර්ඝකාං ප්‍රාවෘතාං පශ්‍ය තීරජෛඃ සින්ධුවාරකෛඃ)**[33] යන්නෙන් අවධාරිත ය. ඝන පඳුරු විස්තෘත කොට තිබෙන්නේ **ගුලං** යනුවෙනි. කටු සහිත පඳුර **ශර්ගුලං** ලෙසිනි.[34]

(5) ලතාවන් පුෂ්පයන්ගෙන් ආකූල වූ බව **(වල්ලීරණාං)**[35] යන පාඨයෙන් ඉස්මතු වේ. අතිමුක්ත ලතාවගේ ප්‍රබෝධකරණය අඹ වෘක්‍ෂයට ඉතා සමීපයෙනි. **(ලතා ප්‍රඵුල්ලාමතිමුක්තකස්‍ය)**[36]ඇතැම් ලතාවන්   විෂ සහිත ය. තවත් ඒවා ස්වකීය පුෂ්පයන්ගෙන් රොන් ලබා ගනිති.[37] ලතාවන්හි පවතින සියුමැලි පියකරු බව චංචල වීම ස්ඵුට කරන්නේ මෙපරිද්දෙනි. එනම් මේඝයෙන් චලිත ව අස්ථාවර ව සෑම දිශාවකට ම යොමු වන්නාක් මෙනි යන ප්‍රකාශයෙනි.[38]

(6) ඍග්වේදයේ **දර්භ** ලෙසින් විස්තෘත කුස ගස සබැඳි වූ මෘදු තෘණය **ශාද්වල** යනුවෙන් ප්‍රකාශිත ය. **(ශාද්වලාස්තීර්ණ භූතලම්)**[39] ඒවා වෛඩූර්ය මෙන් දීප්තිමත් ය. **(වෛඩූර්යනිකාශශාද්වලයාම්).**[40] Tarai දිවයිනෙහි තපෝවනවාසී සමහර තාපසවරු තෘණ ගසින් යැපුණු බව දැක්වේ.[41] අශ්වඝෝෂ හිමිට අනුව බුදුරජාණන්වහන්සේ බුද්ධත්වයට පත්වීමට පෙර තෘණ වළඳා ඇත.[42]

(7) වර්ණය, ආකෘතිය, ඍතුවලට අදාළ ව ගන්ධය ආදී වශයෙන් විවිධ පුෂ්පවර්ගයන් සම්බන්ධයෙන් අශ්වඝෝෂ හිමි කරුණු දක්වා තිබේ. අලංකාර අධ්‍යාශයන් සඳහා ධවල හා පියකරු වූ ශීතපුෂ්පය[43] යොදා ඇති අතර මාධවී පුෂ්පය[44] පූජා කටයුතු සබැඳි ව ප්‍රයුක්ත වීය. සිද්ධාර්ථ කුමරු සමීපයේ විසුරුණු මන්දාර පුෂ්ප[45] යන්නෙන් පෙනෙන්නේ ද එහි තිබූ පූජාමය වැදගත්කමයි. අගස්ත්‍ය[46] කොඳ[47]



Created with nitroPDF professional
download the free trial online at nitropdf.com/professional

සපු[48] කර්ණිකාර[49] ආදී පුෂ්ප වර්ග ද වර්ණිත ය. **(සුරභි සුජශ් ච)**[50] යන්නෙන් පෙනෙන විධියට සුගන්ධිත පුෂ්පයන් මල්මාලා නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇත. තවද අඹමල් පිපෙන අවස්ථාව කොවුලන් පවා ආකර්ෂණය කළ බව පහත ශ්ලෝකයෙන් ස්ඵුට වේ.

**''පශ්‍ය හර්තශ්චිතං චූතං**
**කුසුමෛර්මධුගන්ධිභිඃ**
**හේමපජරරුදෙධා වා**
**කොකිලා යත්‍ර කූජති''**[51]

(8) කහ හෝ කේශර යනාදිය බහුල ව හිමාලය කඳු බෑවුමේ වැඩී තිබුණි. කපිල ගෞතම ඍෂිවරයාගේ ආශ්‍රම භූමියෙහි පීත වර්ණිත පාපිස්සක් තිබූ බවත්, එය කහවලින් හෝ කේශරවලින් නිම වූවක් ලෙස සලකා ඇත. **(කේසරාස්තරපාණ්ඩුභි)**[52] එසේම පුෂ්ප සහ පැල අතුරින් නෙළුමට සුවිශේෂී ස්ථානයක් හිමිව තිබේ. පද්ම යන නාමයෙන් බොහෝ විට ප්‍රයුක්ත වූ එමගින් සුන්දරිය සම්බන්‍ධ ව දක්වන සිදුවීම් ඉතා කමනීය වේ.

**''සා පද්මරාගං වසනං වසානා**
**පද්මනානා පද්මාදලායතාක්ෂි**
**පද්මා විපද්මා පතිදේව ලක්‍ෂමී**
**ශුශේෂ පද්මස්ත්‍ර ශිවෙතපේන**[53]

වනයන් ද නෙළුම් සහිත පොකුණුවලින් ආඪ්‍යය. **(පද්මාකරමණ්ඩිතානි)**[54] එසේම සිදුහත් තාපසතුමා බුද්ධත්වයට පත්වූ පසු දිව්‍යලෝකයන් නෙළුම් සහ රත්රන්, වෛරළුමිණි වර්ණිත දිය නෙළුම් (Water lillies) යුක්ත වූ මාණික්‍ය වර්ෂා පැවත් වූ බව අශ්වඝෝෂ හිමි සඳහන් කෙළේ මෙපරිද්දෙනි. **(දිවඃ හේතුඃ සුවර්ණානි මාණික්‍යාදීනි වෛතථා)**[55] නෙළුම් පොකුණුවල දක්නට ලැබෙන විශේෂතා පිළිබඳ ව ද කතුවර යතිවරයාණෝ කරුණු දක්වති. උත්පල හා රතුපැහැති කමල ඒ ආදිය අතර වෙති. **(නලිංනතඩාඛෙගන)**[56] **(ප්‍රඵුල්ලනීලෝත්ඵල)**[57] **(නීලෝත්පල)**[58] **(රක්තානි ඵුල්ල, කමලානි)**[59] **(කමලනිභෛඃ කමලානි ච ප්‍රබිධ්‍ය)**[60] පුෂ්කර් යනු නිල්මහනෙල් මලයි. **(නව පුෂ්කරගර්භ කෞමලාභ්‍යාං)**[61] තවද තාමර හෙවත් සුදුනෙළුම් හා නලින යන පුෂ්ප ද්විත්වය නිරතුරු ව ම අවධානය දිනා ගත්තා වූ බව පෙනේ.[62] දිය නෙළුම් සම්බන්ධ කරන්නේ පාරිජාත වෘක්‍ෂය සමග ම ය.[63] ඊට හේතුව පාරිජාත වෘක්‍ෂය දිය නෙළුම් හා රතු නෙළුම් සමග ඒකාබද්ධ වන නිසාය. **(කුශෛශයාශ් ච පුෂ්පානතාන කෞකනදාංශ්ච වෘක්‍ෂාන්)**[64]

මේ අනුව අශ්වඝෝෂ හිමිගේ කෘතීන්හි තදීය යුගයේ ප්‍රයුක්ත වූ වෘක්‍ෂලතා පිළිබඳ ව ප්‍රාමාණික කරුණු රැසක් අඩංගු වන බව කිවමනාය. අශ්වඝෝෂ හිමිගේ කෘති තුළ ප්‍රසාරිත සත්ත්ව වර්ග පිළිබඳ ව අධ්‍යයනයේ දී සුඛාවබෝධය සඳහා පහත පරිදි වෙන් කර ගැනීමක් කරගත හැකිය.



Created with nitroPDF professional
download the free trial online at nitropdf.com/professional

1) නපුරු සත්ත්වයන්

2) හීලෑ සත්ත්වයන්

3) උරගයන්

4) ජලචරයන්

5) කුරුල්ලන්

(1) තදීය යුගයේ සිටි නපුරු සතුන් ලෙස අශ්වඝෝෂ හිමි හඳුනාගත්තේ සිංහයා (**සිංහ**[65]/**මෘගරාජ**[66]) කොටියා (**ව්‍යාඝ්‍ර**)[67] වලසා (**ශාර්දූල**[68]/**රක්‍ෂ**[69]) ප්‍රචණ්ඩ බැටළුවා[70], තිබ්බතීය යැක් ගවයා(**යාක්**)[71] යනාදියයි.

(2) හීලෑ සතුන් ලෙස දක්වා ඇත්තේ ඇතා, අශ්වයා, ඔටුවා, ගවයා සහ වෙනත් වල් සතුන් ය. ඇතාට යොදා ඇති නම් අතර ද්වීප හා ද්වීපේන්‍ද්‍ර[72], ද්විරද්[73] ගජ[74], ගජේන්‍ද්‍ර[75], හස්ති[76], කරින්[77], කරේණු[78] (ගැහැණු ඇතින්න), කුන්ජර්[79], කලභ්[80], නාග[81], ඍෂභ[82], වාරන්[83] හා ඓරාවත[84] යනාදී නාමයන් ප්‍රමුඛ ය.

හිමාලය වනයේ දී ඇතා දක්‍ය ගත හැකි වූ බව පෙනේ. (**හේමවතා ගජාස්තේ**)[85] (**යූථසහිතඃ කරීවහිමවද්වනම්**)[86] ඇතුන් අල්වන්නන් එකී කාර්යය සඳහා වනගතව යොදා තිබුණි. (**මණ්ඩල ශාක්‍යම්භාභිනේතුම් - යත්නදූපස්ථුරේනම්**)[87] පාලනය කරනගත නොහැකි ඇතුන් සඳහා අංකුසයන්ගේ උපකාරය ලබාගත් බව පෙනේ. (**ගජා ඉව නිරඞකුශා**)[88] සුද්ධෝධන රජුගේ කපිලවස්තු පුරයේදී විවිධ වර්ගවල අශ්වයන් හමුවේ. යුද්ධයට සහ ගමනාගමනයට යොදාගත් අශ්වයන් අතර කන්ථක ප්‍රමුඛ ය. වඩාත්ම ප්‍රියජනක අශ්වයා දිගු කේශර හා දිගු නිකට යනාදියෙන් ප්‍රයුක්ත පළල් නාසයක් හා නළලක් සහිත ය.[89] අශ්වඝෝෂ හිමි විසින් දක්වන අශ්ව වර්ග අතර තුර්ග[90], තුරංග[91], වාජිවර[92], අශ්ව[93], සහ හය[94] යනාදිය ප්‍රධාන ය. වර්ණයෙන් උසස් වන්නේ ධවල වර්ණිත අශ්වයා යි. (**සිතහසිතගති ද්‍යුතිර්වපුෂ්මාන්**)[95] ශක්තියෙන් පරිභාවිත ආජානේය අශ්වයා හඬලන්නේ තමාට කරදරයක් ඇති වූ විට පමණක් වන බව අශ්වඝෝෂ හිමිගේ මතයයි. (**හනුස්වනං**)[96] තද්කාලයේ ඔටුවන් ද වාසය කළ බව අශ්වඝෝෂ කෘති තුළින් විද්‍යමාන වන්නකි. (**උෂ්ට්‍ර**)[97] ගෘහස්ත සත්ත්වයන්ගෙන් සුදර්ශිත වන්නාහු ගවයා සහ වස්සායි.[98] කිරියෙන් පරිපෝෂිත වූ රත්රන් පැහැති



Created with nitroPDF professional
download the free trial online at nitropdf.com/professional

අං ඇති ගවයන් සහිත වසු පැටවුන් සුද්ධෝදන රජතුමා විසින් ස්වකීය පුත්‍රයාගේ සෞභාග්‍යය අපේක්ෂාවෙන් පරිත්‍යාග කළ බව දැක්වේ. **(බහුක්ෂීරදුහශ්ච ගාවඃ)**[99] ගව කිරි පිරිසිදු මෙන් ම, යාග කටයුතු සඳහා ද පරිහරණය කොට ඇත. තවද ගවයන් ව පෝෂණය කිරීම සහ සතුටු කිරීම පුණ්‍යමය රාජකාරියක් ලෙස පැවතුණු බව අශ්වඝෝෂ හිමිගේ අදහසයි.[100] කතුවරයා විසින් දක්වන අනෙකුත් සතුන් අතර මීහරකා **(මහිෂී)**[101], බැටළුවා **(උරභ්‍ර )**[102], ගර්විත ගොනා[103] යනාදීන් ද සැලකුව මනාය. මොවුන්ට අමතරව ඌරා **(සූකර)**[104] බූරුවා[105] මුවා **(මෘග)**[106] මුවදෙන **(මෘගී)**[107] තිත්මුවා **(හරිණී)**[108] සුනඛයා[109], බළලා **(මාර්ජාර)**[110] වඳුරා (**වානර**[111]/**කපි**)[112], වඳුරුදෙන **(ශාඛාමෘගී)**[113] යන සත්ත්වයන් ද දෘශ්‍යමාන ය. සැලෙන නෙත් ඇති මුවා අශ්වඝෝෂ හිමිගේ ප්‍රියතමය වූ බව පෙනේ. **(මෘගාශ්චලාක්ෂා)**[114] කැලෑ සතුන් පිළිබඳ ඉතා චමත්කාරාත්මක අවස්ථාව නම් ඔවුන් බුදුරජාණන්වහන්සේ වජ්‍රාසනගත වූ විට කිසිදු ශබ්දයක් නොකළායැයි දැක්වෙන සඳහන හේතුවෙනි.[115]

(3) අශ්වඝෝෂ කෘතිවල දැක්වෙන විවිධ වර්ගයේ සර්පයන් අතර භුජංග[116]ව්‍යාල **(තප්තා ව්‍යාලා ඉව)**[117] උරග[118], කෘෂ්ණ සර්ප[119], සර්ප[120] සහ අහි **(ශත්‍රෝර්නාගන්නේනාහේර්න චාශනෛඃ)**[121] යනාදීන් ප්‍රමුඛ ය. බුද්ධචරිත මහාකාව්‍යයට අනුව භුජංග, කෘෂ්ණ සර්ප සහ සර්ප යනාදීන් විෂඝෝර ය. භුජංගයාගේ ස්වභාවය සපා කෑම ද,[122], කෘෂ්ණ සර්පයා පිළිකුල ද[123], සර්පයා ප්‍රකෝපය ද[124] දක්වයි. සියලු ම සර්පයන් තදනුබද්ධ ව ශබ්ද කරන බවත්, සපා කෑමට අවශ්‍ය වූ විට දරන කරන බවත් පෙනේ.[125] සර්ප දෂ්ටයට ප්‍රතිකාර වශයෙන් පවතින ඖෂධ ද ද සර්පයන් අල්වන්නන්ට විශේෂිත ය. **(යථෞෂධෛර්හස්තගතෛඃ සවිද්‍යොන දශතේ කාශ්චන පන්නගේන)**[126] වෙනත් බඩගා ඇවිදින සතුන් කොටසක් වන කෘමි වර්ග පිළිබඳව ද බුද්ධචරිතයේ කරුණු සඳහන් ය.[127]

(4) ගංගා සහ පොකුණුවල වසන ජලචර සත්ත්වයන්ගෙන් කිඹුලා විශේෂිත ය. **(සරිතං ග්‍රාහවතීං)**[128] **(සරිතෝ ග්‍රාහකුලා, කුලා)**[129] කතුවරයා විසින් කිඹුලන් වසන නිශ්චිත ගංගාවක් පිළිබඳ කරුණු ප්‍රකාශ නොකළත්, විශාල ප්‍රමාණයේ ගංගාවන් ඔවුන්ගෙන් ගහණ ව පැවැති බව ප්‍රකාශ කරයි. **(ග්‍රාහාකුල චාම්බ්වව සාරබින්දං)**[130] සාගරයේ සහ මානස ජලාශයේ වාසය කළ අනෙකුත් ජලචර සත්ත්ව වර්ග නම් මත්ස්‍ය **(මීන)**[131] හංස[132] යනාදියයි. තවද සාගරාශ්‍රිතව ඉදිබුවන් ද වාසය කොට ඇත.[133]

(5) අශ්වඝෝෂ හිමිගේ කෘතිවල දී කුරුල්ලන් සඳහා පාරිභාරික පද රැසක් භාවිත වූ බව දැක ගත හැකිය. එනම් විහග[134], ඛග[135], අණ්ඩජ[136] සහ පක්ෂි[137] යනාදියයි. නූතන භාරතයේ ජාතික පක්ෂියා ලෙස සැලකෙන මොනරා දැක්වෙන්නේ මයුර, ශිඛණ්ඩි[138] සහ විනීලකණ්ඨ[139] යන නම්වලිනි. කළු වැහි වලාකුලක සම්ප්‍රාප්තියේ දී සතුටට පත් මොනරා නාද කරන බව බුද්ධචරිතයේ දී දැක්වේ. **(දෘෂ්ටශ්ච**



Created with nitroPDF professional
download the free trial online at nitropdf.com/professional

**කේකා මුමුංචුර්මයුරා දෘෂ්ට්වාම්බුද නීලම්වෝන්නමන්තඃ)**[140] මොනරාගේ ශබ්දයේ මාධුර්යය වනයේ චමත්කාරය පැවසීමට හේතුවක් වන බව අශ්වඝෝෂ හිමිගේ මතයයි. **(මයුරනාදප්‍රතිපූර්ණකුඤ්ජ)**[141] ද්විතීය ව අපට දකගත හැකි ප්‍රකට කුරුල්ලෙකු නම් කොවුලා යි. **(සංරවතකණ්ඨෛශ්ච)**[142] **(කෞකිල)**[143] **(පුංස්කෝකිලෝ)**[144] කොවුලාගේ ශබ්දය රාගය පහල වීමට ද හේතුවක් වේ.[145] නගර උයන සඳහා සිත් ඇලවීමට සිද්ධාර්ථ කුමරුට එක් හේතුවක් වූයේ කොවුල් නාදයයි.[146] පරෙවියන් පිළිබඳ අශ්වඝෝෂ හිමිගේ අදහස නම් ඔවුන්ව ගොඩනැගිල්ලක ඉහල මාලයක තබා තිබූ බවයි. **(පාරාවතෛඃ කූජන ලෝලකණ්ඨෛඃ)**[147] **(ගෘහපක්ෂි සංධානනෝන්‍යෝන්‍යවේගාංශූච සමාක්ෂිපන්ත්‍යඃ)**[148] මුනිවරයා ගුරුලෙකු ලෙස නොසැලෙන නොබියවන තත්වයට පත්වන බව සඳහන් කිරීමෙන් එම සත්ත්ව වර්ගය පිළිබඳව අදහසක් ලබාගත හැකි ය. **(මුනිර් න තත්‍රාස න සංකුකෝච බෛර්ගුරුත්මානිව වායසානාම්)**[149] නීලකණ්ඨයා ද බුද්ධචරිත මහාකාව්‍යයේ සඳහන් වන තවත් ශුභදායී කුරුල්ලෙකි.[150] මධුර ලෙස ගී කියන ශිඤ්ජීරිකා නම් පක්ෂි විශේෂයට රන් පැහැති පියාපත් හා වෛරෝඩි පැහැති ඇස් ඇත. **(ශිඤ්ජීරිකා)**[151] උකුස්සාට බිය වන සැවුලා ද සෞන්දරනන්දයේ සහ වජ්‍රසූචියේ සඳහන් වෙන්නෙකි. **(ජීව ජීවක)**[152] විලාප නගන තත්වයන්ට බොහෝ ප්‍රසිද්ධ වූ ස්ත්‍රී කුරලයා **(කුරරී)**[153] සහ ව්‍යවහාරයේ සුප්‍රකට කපුටා ද බුද්ධචරිතයේ සඳහන් වේ. **(වායසානාම)**[154] මොවුන්ට අමතර ව මැස්සා **(මක්ෂිකා)**[155] මී මැස්සා **(භ්‍රමරා)**[156] සලබයා **(ශලභ)**[157] යන සත්ව ප්‍රභේද ත් කාරණ්ඩව[158] හා චක්‍රවාක[159] යන තාරා ජාතියට සමාන කුරුළු වර්ගයත් අශ්වඝෝෂ හිමිගේ දෘෂ්ටිපරාසයට හසු වී ඇත. මොවුන්ගේ ප්‍රේමනීය භාවය ද සෞන්දරනන්දයේ ඉස්මතු කර ඇත.[160]

සමාලෝචනාත්මක ව ආවිර්භවිත කරුණක් වනුයේ  අශ්වඝෝෂාචාර්යපාදයන් ස්වකීය ජීවන කාලයේ දෘෂ්ටිගෝචර වූ  වෘක්ෂලතා සහ සත්ත්ව වර්ග  පිළිබඳ පරිචිත බවකින් යුක්ත ව නිර්මාණකරණයේ යෙදී ඇති බවයි.



Created with nitroPDF professional
download the free trial online at nitropdf.com/professional

# ආන්තික සටහන්

1. B.I.72
2. B.VII.32
3. B.III.121
4. S.XVI.86
5. B.XI.17
6. B.X.21
7. S.X.5
8. B.XIII.68
9. B.XII.121
10. B.VIII.32
11. S.I.9
12. B.XIII.40
13. S.X.26
14. S.VII.9
15. V.5.53
16. S.VII.10
17. S.IV.20
18. S.IV.33
19. S.VII.7
20. S.X.11
21. S.VII.6
22. S.VIII.6
23. B.XIII.23
24. B.IV.43
25. V.5.53
26. B.XIV.6
27. B.IV.35
28. B.XII.101
29. B.XII.96
30. S.X.22
31. S.X.3
32. S.XVI.97
33. B.IV.49
34. V.5.8
35. S.X.13
36. S.VII.8
37. S.VIII.3
38. B.XI.68
39. B.III.1
40. B.V.9
41. B.VII.15
42. B.XII.119



Created with nitroPDF professional
download the free trial online at nitropdf.com/professional

| | |
|---|---|
| 43. | B.I.86 |
| 44. | B.VII.4 |
| 45. | B.I.19 |
| 46. | V.5.8 |
| 47. | V.5.18 |
| 48. | V.5.33 |
| 49. | B.V.3 |
| 50. | B.IV.40 |
| 51. | B.IV.44 |
| 52. | S.I.7 |
| 53. | S.XI.26 |
| 54. | B.III.1 |
| 55. | B.XIV.92 |
| 56. | S.I.8 |
| 57. | S.IV.16 |
| 58. | B.I.21 |
| 59. | S.VI.11 |
| 60. | B.V.81 |
| 61. | B.V.50 |
| 62. | S.XI.2 |
| 63. | S.X.26 |
| 64. | S.X.26 |
| 65. | S.X.9 |
| 66. | S.VIII.44 |
| 67. | S.I.37 |
| 68. | S.X.12 |
| 69. | B.XIII.19 |
| 70. | S.XI.25 |
| 71. | S.X.11 |
| 72. | S.V.53 |
| 73. | B.V.82 |
| 74. | S.I.34 |
| 75. | S.XII.11 |
| 76. | S.I.52 |
| 77. | B.V.29 |
| 78. | S.IV.40 |
| 79. | V.S.31 |
| 80. | S.VIII.16 |
| 81. | S.I.36 |
| 82. | S.I.61 |
| 83. | B.X.21 |
| 84. | S.II.50 |
| 85. | B.II.3 |
| 86. | B.IV.27 |
| 87. | B.II.3 |



Created with nitroPDF professional
download the free trial online at nitropdf.com/professional

| | |
|---|---|
| 88. | S.I.34 |
| 89. | B.V.73 |
| 90. | S.III.20 |
| 91. | B.II.1 |
| 92. | B.VIII.45 |
| 93. | B.II.1 |
| 94. | S.III.1 |
| 95. | B.V.79 |
| 96. | B.VIII.4 |
| 97. | B.XIII.19 |
| 98. | B.I.84 |
| 99. | B.II.5 |
| 100 | B.VII.6 |
| 101 | B.VIII.24 |
| 102 | B.XIII.23 |
| 103 | B.VII.13 |
| 104 | S.VIII.60 |
| 105 | B.XIII.19 |
| 106 | B.I.12 |
| 107 | S.IV.39 |
| 108 | S.I.12 |
| 109 | B.XIV.14 |
| 110 | B.XIII.23 |
| 111 | B.XII.21 |
| 112 | S.X.14 |
| 113 | S.X.15 |
| 114 | B.VII.5 |
| 115 | B.XII.121 |
| 116 | B.VII.15 |
| 117 | S.I.38 |
| 118 | S.II.22 |
| 119 | B.IX.43 |
| 120 | B.XI.24 |
| 121 | S.XIII.31 |
| 122 | B.XI.2 |
| 123 | B.IX.43 |
| 124 | B.XI.24 |
| 125 | B.XIII.30 |
| 126 | S.V.31 |
| 127 | B.VII.15 |
| 128 | S.VIII.17 |
| 129 | S.VIII.37 |
| 130 | B.IX.41 |
| 131 | B.XIII.11 |
| 132 | B.VI.57 |



Created with nitroPDF professional
download the free trial online at nitropdf.com/professional

| | |
|---|---|
| 133 | S.XVIII.27 |
| 134 | S.XI.59 |
| 135 | B.XIII.53 |
| 136 | B.I.26 |
| 137 | do |
| 138 | S.I.11 |
| 139 | S.VII.11 |
| 140 | B.VII.5 |
| 141 | B.X.15 |
| 142 | S.VII.11 |
| 143 | V.S.32 |
| 144 | B.III.1 |
| 145 | B.IV.51 |
| 146 | B.III.1 |
| 147 | S.VI.8 |
| 148 | B.III.15 |
| 149 | B.XIII.54 |
| 150 | B.XII.118 |
| 151 | S.X.29 |
| 152 | S.VIII.20 |
| 153 | B.VIII.51 |
| 154 | B.XIV.14 |
| 155 | S.VIII.54 |
| 156 | B.IV.45 |
| 157 | B.XI.35 |
| 158 | B.V.53 |
| 159 | S.VI.30 |
| 160 | S.X.4 |



Created with nitroPDF professional
download the free trial online at nitropdf.com/professional

## කෙටි යෙදුම්

B- බුද්ධ චරිත මහාකාව්‍යය

S -සෞන්දරනන්ද මහාකාව්‍යය

V -වජ්‍රසූචි

## ආශ්‍රිත ග්‍රන්ථ


**Buddhacarita, E.H Johnston, Motilal Banarsidass, 1978.**

**The Saundarananadakavya, E.H Johnston, Delhi, 1975.**

**Vajrasuci of Asvaghosa,Sujit Kumar Mukhopadhyaya,Visvabharati,Santiniketam, 1960.**




Created with nitroPDF professional
download the free trial online at nitropdf.com/professional